**සීමාසහිත දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය - 2017**

-----------------------------------------------

සීමාසහිත දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ ("සමාගම") 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මෙම වාර්තාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් (SLFRS for SMEs) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ( "Board") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1. 4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

(අ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී ආදායම රු. 206,676 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් රු. 4,172,925 ක් ලැබිය යුතු ලෙස දක්වා තිබුණි. කෙසේ වුවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව එවැනි වටිනාකමක් සමාගමට ගෙවිය යුතුව නොතිබුණි.

(ඇ) 2017 අංක 07 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනතෙහි විධිවිධාන අනුව සමාගම 2017 වර්ෂය සඳහා ආර්ථික සේවා ගාස්තු ගෙවීමට යටත්වේ. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා රු. 193,194 ක් වූ ආර්ථික සේවා ගාස්තු සඳහා වෙන් කිරීම් කර නොතිබුණි.

(ඇ) සමාගම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ( SLIDA) සතු ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන අතර 2001 සිට 2003 වර්ෂය දක්වා අවුරුදු 02 ක බදු පදනම මත ලබා ගෙන තිබුණි. පසුව එම බදු කාලය නිමවූ පසු සමාගම මෙම ගොඩනැගිල්ලට රු. 49,651,765 ක් වැය කරමින් අළුත්වැඩියා කර තිබුණි. ඉන්පසු සමාගම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමග අවුරුදු 30 ක කාලයකට බදු ගිවිසුමකට එළඹ තිබුණු අතර එම ගොඩනැගිල්ල අළුත්වැඩියාව සඳහා වැයකළ වටිනාකම අඩු කරමින් වාර්ෂික පදනමට රු. 1,655,059 ක් බැගින් ක්‍රමක්ෂය කර තිබුණි. ගිවිසුම අනුව ගොඩනැගිල්ලේ වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානය වන විට ක්‍රමක්ෂය කළ යුතු වටිනාකම රු. 24,825,882 ක් විය යුතු විය. කෙසේ වුවද , සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.23,543,166 ක් වශයෙන් දක්වා තිබුණි. එබැවින් මෙම සංඛ්‍යාවන් දෙක අතර රු.1,282,716 ක වෙනසක් නිරීක්ෂණය විය.

**වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම**

---

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 ( 2 ) වගන්තියෙහි නියම කර ඇති පරිදි පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

( අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමාකිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

(ආ) මාගේ මතය වනුයේ,

- මතය තත්ත්වාගණනය කිරීම සඳහා පදනම දැක්වෙන ඡේදයේ දක්වා ඇති කරුණු වලින් විය හැකි බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවන්ට අනුකූලව ඉදිරිපත් කර ඇති බවත්ය.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---

මතය තත්ත්වාගණනය කිරීම සඳහා පදනම දැක්වෙන ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සීමාසහිත දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් (SLFRS for SMEs ) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2. 2 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ වලට අනුකූල නොවීම්

-----------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| චක්‍රලේඛ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති පීඊඩී 12 චක්‍රලේඛය | |
| (i) 4.2.6 වගන්තිය | කාර්තුමය කාර්යසාධන වාර්තා රේඛීය අමාත්‍යාංශයට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත් සමාගම ඊට අනුකූල වන පරිදි කටයුතු කර නොතිබුණි. |
| (ii) 5.2.4 වගන්තිය | කෙටුම්පත් අයවැය ලේඛනය මුදල් වර්ෂය ආරම්භ වීමට මාස 03 කට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ වුව ද අයවැය ලේඛනය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණේ 2017 මාර්තු 28 දින දී ය. |
| (iii) 8. 2.2 වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ දී සිදුකරන ලද රු.61,987,684 ක් වූ ආයෝජන සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (iv) 8. 3.3 වගන්තිය | අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාගම විසින් දිරිදීමනා යෝජනා ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක කරමින් තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ දී ගෙවන ලද මුළු දිරිදීමනා වටිනාකම රු.572,243 ක් විය. |
| (v) 9.2 ( අ) වගන්තිය | සංවිධාන ව්‍යුහය හා කාර්යය මණ්ඩලය මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් අනුමත කළ යුතුය. එහෙත් සමාගම එම අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට අපොහොසත් වී තිබුණි. |
| (vi) 9.3.1 වගන්තිය | සෑම රාජ්‍ය ව්‍යාපාරයක්ම සතුව බඳවා ගැනීම හා උසස් වීම් පටිපාටියක් තිබිය යුතු වුවත්, සමාගම සතුව එවැනි අනුමත කළ බඳවා ගැනීම් හා උසස් වීම් පටිපාටියක් නොතිබුණි. |
| (vii) 9.7 වගන්තිය | මහා භාණ්ඩාගාර ලේකම්ගෙන් අනුමැතිය ලබා ගැනීමකින් තොරව පුරුද්දක් වශයෙන් සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වැටුප්, දීමනා, වැටුප් වර්ධක තීර්ණය කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | අංක පීඊඩී /2015 / 01 හා 2015 මැ යි 25 දිනැති චක්‍රලේඛය 3.1 වගන්තිය | ප්‍රධාන විධායක නිලධාරීන්ට (CEO) අනුමත කළ උපරිම මාසික ඉන්ධන දීමනා සීමාව ලීටර 150 (රු. 17,500) කි. එසේ වුව ද සමාගම ඒ වෙනුවට ලීටර 193 ක් වෙනුවෙන් රු. 22,500 ක් මාසික ඉන්ධන දීමනාව ලෙස 2013 වර්ෂයේ සිට ප්‍රධාන විධායක නිලධාරී වෙත අනුමත සිමාව ඉක්මවා ගෙවා තිබුණි. |

**2.3 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

-----------------------------------------------------------------

විගණනයට භාජනය කළ ස්ථාවර තැන්පතුවල ආරම්භක ශේෂය නිවැරදි කිරීමට හා දීර්ඝ කාලයක සිට හිඟ හිටිව පැවැති උපචිත වියදම් කපා හැරීම සඳහා වූ රු.176,455 ක ජර්නල් සටහන් සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර විගණනයට ඉදිරිපත් නොකෙරුනි.

**3. මූල්‍ය සමාලෝචනය**

----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු. 13,017,604 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු. 7,760,261 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 5,257,343 ක වර්ධනයක් දැක්වුණි. සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම රු. 18,691,939 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

-------------------------------

**4.1 කාර්යයසාධනය**

------------------

**4.1.1 ඉලක්ක ළඟා කර ගැනීම**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමේ සමස්ත අරමුණ වූයේ රාජ්‍ය හා පෞද්ගලික අංශවල ධාරිතා වර්ධනය හා දුරස්ථ අධ්‍යාපන අවස්ථා සහ දැනුම බෙදාහැරීමේ වැඩසටහන් සැපයීම වේ. කෙසේ වුව ද, මෙම අරමුණ ඉටු කිරිමට සමාගම ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි**.**

(ආ) සමාගම විශේෂිත වෙළඳපොළ වැඩසටහන් ආරම්භ කිරීමට නියෝජිතායතන 4 ක් තෝරා ගැනීමට හා අභ්‍යන්තර කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් 02 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණ ද මෙම කාර්යයන් සමාලෝචිත වර්ෂය තුළ දී ක්‍රියාත්මක කර නොතිබුණි. තව ද අභ්‍යන්තර ක්‍රියාවලින් හා පරිපාටීන් වැඩි දියුණු කිරීමට හා සංවර්ධනය කිරීමට S – 5 සහ ISO තත්ත්ව කළමනාකරණ ක්‍රම ක්‍රියාත්මක කිරීමේ දී සියයට 50 ක් පමණක් ඉටු කර ගැනීමට හැකිව තිබුණි.

**4.2 මෙහෙයුම් දූර්වලතා**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ ) සමාගම විසින් දිරිදීමනා ගෙවීමේ දී නියමිත කාල සිමාවේ ශුද්ධ ලාභය සලකා බැලීම වෙනුවට දල ලාභය පදනම් කර දිරිදීමනා ගෙවමින් තිබුණි. තව ද 2017 ජනවාරි, අප්‍රේල් හා ජුනි මාසවල ශුද්ධ මෙහෙයුම් පාඩුවක් වාර්තා වී තිබුණ ද සමාගම එහි කාර්ය මණ්ඩලයට එම මාසවල දිරි දීමනා ගෙවා තිබුණි.

(ආ) තොරතුරු තාක්ෂණ කළමනාකරු ඔහු සමාගමට ගෙන එනු ලබන විකුණුම් මත දළ ලාභයෙන් සියයට 1 ක කොමිස් මුදලක් සහ ඊට අමතරව සමාගමේ අනෙකුත් සියලුම සේවකයන්ට අදාළ වූ දළ ලාභයෙන් සියයට 1.5 ක දිරි දීමනාවකට ද හිමිකම් ලබයි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

------------------------------------------

### 5.1 විගණන කමිටු

----------------

අංක PED/ 12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තියේ විධි විධාන අනුව, විගණන කමිටුව ක්‍රමානුකූල පදනමකට අවම වශයෙන් මාස 03 කට වරක් පැවැත්විය යුතුය. කෙසේ වුවද 2017 වර්ෂයේ දී විගණන කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

### 5. 3 අයවැය පාලනය

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අයවැය ගත හා සත්‍ය ආදායම හා වියදම අතර සියයට 74 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායීව කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

(ආ) සමාගම විසින් කාර්තුමය සාරාංශ 2003 ජුනි 02 දිනැති අංක PED චක්‍රලේඛ 12 හි 4.2.6 වගන්තියෙහි විධිවිධාන අනුව සකස් කර තිබුණු නමුත් අයවැය ඇස්තමේන්තුව සමඟ එම වාර්තා විධිමත්ව සමාලෝචනය කිරීමට සහ අයවැය ගත ඉලක්ක ඉෂ්ට කර ගැනීම සඳහා අවශ්‍ය කිසිදු වෙනසක් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමාගමේ ප්‍රධාන විධායක නිලධාරීගේ අවධානයට වරින් වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පාලන ක්ෂේත්‍රය | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) කාර්ය මණ්ඩල කළමනාකරණය | - | නිවාඩු, වැටුප් රහිත නිවාඩු හා කාර්ය මණ්ඩලයේ පැමිණීම පිළිබඳ සුදුසු අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. |
| (ආ) දිරි දීමනා ගෙවීම | - | ඉලක්ක ඉටු කර ගැනීම, අළුතින් ආරම්භ කළ වැඩ සටහන්, පවත්වන ලද වැඩසටහන් වල ගුණාත්මකභාවය, ඒක පුද්ගල කාර්ය සාධනය, ණය එකතු කිරීම යනා දී කරුණු දිරි දීමනා ගෙවීම් කිරීමේ දී සැලකිල්ලට ගත යුතු වේ. |